# 2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## කොහුවල-537 B



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 537 B - කොහුවල

## ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සංවර්ධන නිලධාරී

මධුෂංක බණ්ඩාර මහතා

# පටුන

පිටු අංක


1. පිහිටීම 01
2. වසමේ සිතියම 02
3. සාමාජීය හා සංස්කෘතික කරුණු 03-04
4. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම 05-07
5. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ( පාසැල් පද්ධතිය) 08
6. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ( ආගමික ස්ථාන ) 09
7. ජීවනෝපාය ව්‍යවසාය සංවර්ධන කාන්තා සවිබලකරන සැලැස්ම 10-12
8. කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම 13
9. පරිසර කලමණාකරන සැලැස්ම 14-17
10. සමාජ සංවර්ධන සැලැස්ම 18-19
11. නිපුණතා සංවර්ධනය හා හැකියා වර්ධන සැලැස්ම 20-21
12. වසමේ ඇති වැදගත් ස්ථාන
    I. ආගමික ස්ථාන 22
    II. පෙර පාසැල් 22
    III. ව්‍යාපාරික ස්ථාන 22
    IV. පාසල්/විශ්ව විද්‍යාල 22
    V. රාජ්‍ය ආයතන 23
    VI. වෘත්තීය පුහුණු ආයතන 23
13. වසමට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් 24
14. වසමේ දේශපාලන බල අධිකාරිය 24

## 01.පිහිටීම

බස්නාහිර දිස්ත්‍රික්කයට අයත් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කින් සමන්විත වෙයි. කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 අතුරින් දෙහිවල ලංකාවේ දෙවැනි මහ නගර සභාව දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. එය කොළඹ මහ නගර සභාවට පසු ලංකාවේ ආදායම් මාර්ග අතුරින් වැඩිම අදායම් ලබන මහ නගර සභාව වීම සුවිශේෂී වෙයි. වර්තමානයේදී දෙහිවල රත්මලාන එක් පරිපාලන ඒකකයක් ලෙස පවත්වා ගෙන යන අතර පළාත් සභා බලතල යටතේ දෙහිවල රත්මලාන දෙහිවල මහ නගර සභාව මූලික කර ගෙන පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි.මධ්‍යම රජය යටතේ ස්වදේශ කටයුතු අමාත්‍යංශය යටතේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි.


1992-11-30 රජයේ ගැසට් පත්‍රය මගින් එවකට රාජ්‍ය ඇමතිවරයා වූ ෆේස්ටස් පෙරේරා මහතා විසින් දෙහිවල වෙනම පරිපාලන එකකයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. වර්ග කිලෝමීටර් 5 ක පමණ වන භූමි ප්‍රමාණයකින් සමන්විත දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරි වසම් 15 කින් සමන්විත වෙයි. මුළු ජනගහනය එක්ලක්ෂ අනූහත් දහසකට ආසන්න වෙයි. බහු ආගමික ජනවර්ග වෙසෙන දෙහිවල අධි නාගරික ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වේ.

පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා වූ අවශ්‍ය වන්නා වූ සේවාවන් රාශියක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ප්‍රජාවට ලබාදීම සිදුවෙයි.ප්‍රදේශයේ සංවර්ධන කටයුතු,ආපදා සහනසේවා,වැඩිහිටි ආධාර දීමනා,සමෘද්ධි දීමනා,විවාහ උප්පැන්න,මරණ ආදී ප්‍රජාවට අවශ්‍ය වන්නා වූ සියළුම සේවාවන් සම්බන්ධීකරණය දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා වර්තමානය වනවිට සිදුවෙයි.

මුහුදු මට්ටමට සමාන්තරව දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පිහිටා ඇති අතර විවිධ රාජ්‍ය ආයතන හා ව්‍යාපාරික ස්ථාන දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයේ පිහිටා ඇත.මෙම ප්‍රදේශයේ ස්ථිර වාසස්ථාන හිමි පුද්ගලයින් මෙන්ම තාවකාලික රැකියාවල නිරතවීමට අධ්‍යාපන අවශ්‍යතාවයන් හා වෙනත් අවශ්‍යතාවයන් සඳහා තාවකාලිකව පදිංචි වූ පිරිස් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත් වේ.

## 02.වසමේ සිතියම

දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 15 අතරින් කොහුවල ග්‍රාම නිලධාරී වසම උතුරින් ශ්‍රී ජයවර්ධනපුර කොට්ටෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනුත් නැගෙනහිරින් මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනුත් දකුණින් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනුත් බටහිරින් දුටුගැමුණු ග්‍රාම නිලධාරී වසම හා කළුබෝවිල ග්‍රාම නිලධාරී වසම 537 බී කොහුවල ග්‍රාම නිලධාරී වසමේ සීමා මායිම් වේ.



## 03.සාමාජීය හා සංස්කෘතික කරුණු

537 බී කොහුවල ග්‍රාම නිලධාරී වසම නාගරික ප්‍රදේශවලින් ප්‍රමුඛතාවයට ගැනෙන වසමක් වෙයි. මෙම වසමේ නුගේගොඩ ශාන්ත ජෝන් ජාතික පාසැල පිහිටා ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අංශය පිහිටා ඇත. 537 බී කොහුවල වසමේ විහාරස්ථාන 4 ක්, කතෝලික පල්ලි 1ක්, මෙහෙණි අරාම 1 ක්, රජයේ බැංකු, පුද්ගලික බැංකු , මූල්‍ය ආයතන වැනි සුවිශේෂී ආයතන මෙම වසම තුල පිහිටා ඇත.

ග්‍රාමීය ප්‍රදේශ වලින් රාජ්‍ය අංශයේ රැකියා, පුද්ගලික අංශයේ රැකියා වල නිරත වීම සඳහා ස්ථිර පදිංචිය, තාවකාලික පදිංචිය සඳහා පැමිණි පුද්ගලයින් මෙම වසම තුල ජීවත් වෙයි. පුද්ගලික පාසල් අධ්‍යාපනය ලබාදෙන පාසැල් 2ක් මෙම වසමේ ඇති අතර ජාතික පාසැල හා ප්‍රාථමික පාසැල් වල අධ්‍යාපනය ලබන පිරිස මෙන්ම විශ්ව විද්‍යාල සිසුන් මෙම වසමේ ස්ථිර, තාවකාලික පදිංචිය ලබාගෙන ඇත.

ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් සංක්‍රමණය වූ පුද්ගලයින් මෙම ප්‍රදේශයේ ජීවත්වන බැවින් ඔවුන් අතර අන්‍යොන්‍ය සුහදත්වය අවම මට්ටමක පවතී. පාරම්පරිකව ජීවත්වන සීමිත පවුල් ගණනක් කොහුවල වසම තුල ජීවත් වෙයි. කොහුවල ග්‍රාම නිලධාරී වසමේ පාරම්පරිකව ගමේ ජීවත්වන පිරිස වර්තමානය වන විට අඩුවෙමින් පවතියි.ඔවුන් සතු පාරම්පරික ඉඩම් වෙනත් ධනවත් පුද්ගලයින් සඳහා අලෙවි කර වෙනත් ප්‍රදේශවලට පදිංචියට යාම බහුල වශයෙන් සිදුවෙයි.ඊට අමතරව තමා සතු ඉඩම් විකුණා විදේශගත වීම නව නිවාස හෝ ඉඩම් කුලියට හෝ බද්දට දීර්ඝකාලීනව ලබාදීම වැනි හේතු නිසා වර්තමානයේ නවක පුද්ගලයින් හා පවුල් මෙම වසමට පැමිණීම වර්ධනය වී ඇත.

537 බී කොහුවල ග්‍රාම නිලධාරී වසම ගම් කිහිපයකින් එක්වී සැදුනු ග්‍රාම නිලධාරී වසමක් නොවන අතර මංමාවත් වලින් කොහුවල සමන්විත වෙයි.

| මාර්ගයේ නම | මුළු ගෙවල් ගණන | මාර්ගයේ නම | මුළු ගෙවල් ගණන |
|---|---|---|---|
| **ආනන්ද පාර** | 41 | හයිලෙවල් පාර | 78 |
| **වෙල්ඩර් පෙදෙස** | 125 | ඇන්ඩර්සන් පාර | 104 |
| **තිස්ස මාවත** | 35 | මල්වත්ත පාර | 94 |
| **අනුර හරස් පාර** | 10 | නාලන්දා පාර | 135 |
| **අනුර මාවත** | 96 | විජය මංගලාරාම පාර | 106 |
| **සුනේත්‍රා දේවී මාවත** | 182 | ශාන්ත ජෝශප් මාවත | 20 |
| **වුඩ්ලන්ඩ් මාවත** | 338 | ජම්බුගස්මුල්ල පාර | 45 |
| **සුමනාරාම පාර** | 39 | එස් ද එස් ජයසිංහ මාවත | 25 |
| **ප්‍රිය මාවත** | 22 | හයිලෙවල් පාර | 75 |
| **ෆිල්ඩ් මාවත** | 6 | ඒකනායක මාවත | 20 |

ජනවර්ගය අනුව 537බී කොහුවල වසමේ ජනගහණය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සිංහල | 6957 | ලංකා දෙමළ | 371 | යෝනක | 379 | වෙනත් | 327 |

ජනවර්ගය අනුව ගමේ නිවාස සංඛ්‍යාව

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| සිංහල | 1139 | දමිල | 63 | මුස්ලිම් | 103 | ක්‍රිස්තියානි | 85 | වෙනත් | 19 |

වසමේ ආබාධිත සංඛ්‍යාව

| | |
|---|---|
| ආබාධිත සංඛ්‍යාව | 08 |

වසමේ වකුගඩු ආධාර දීමනා ලබන සංඛ්‍යාව

| | |
|---|---|
| වකුගඩු ආධාර දීමනාලාභීන් | 02 |

සමෘද්ධිලාභීන් සංඛ්‍යාව

| | |
|---|---|
| සමෘද්ධිලාභීන් සංඛ්‍යාව | 51 |

70 වැඩි වැඩිහිටි ආධාර ලාභීන් සංඛ්‍යාව

| | |
|---|---|
| 70ට වැඩි වැඩිහිටි ආධාර ලාභීන් | 46 |

මහජන ආධාර ලාභීන් සංඛ්‍යාව

| | |
|---|---|
| මහජන ආධාර ලාභීන් | 07 |

## 04.යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම

රටක ගමක දියුණුව සඳහා මහජනතාවට මූලික යටිතල පහසුකම් අත්‍යාවශ්‍ය වෙයි. රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය මැදිහත් වීමෙන් යටිතල පහසුකම් අලුතින් ලබාදීම, තිබෙන පහසුකම් වැඩිදියුණු කිරීම සිදුකල යුතු වෙයි. පුද්ගලිකව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදුකල නොහැකි නුමුත් ප්‍රජාවගෙන් ලබාගන්නා විවිධ ආදායම් මධ්‍යම රජයේ හා පලාත් සභා අරමුදල් වලින් යටිතල පහසුකම් සංවර්ධනය සිදුකල හැකි වෙයි. විශේෂයෙන් එදිනෙදා කාර්යයන් කාර්යක්ෂමව සිදු කර ගෙන යැමට මාර්ග කාණු බොක්කු ඉදිකිරීම මේ යටතට අයත් වෙයි. ප්‍රජාවගේ විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීමට යටිතල පහසුකම් සංවර්ධනය කිරීම නිරන්තරයෙන් සිදුවිය යුතුයි.

**ගැටළුව:-01**

රජයේ නිලධාරීන් සඳහා නිශ්චිත ස්ථානයක් නොමැති වීම නිසා සේවා අවශ්‍යතා ලබාගැනීමට මහජනතාවට හා නිලධාරීන්ට අපහසුතා ඇතිවීම හා නිසිකලට රජකාරී සේවා කටයුතු කර ගැනීමට නොහැකිවීම.

**අරමුණ:-**

රාජ්‍ය නිලධාරීන්ට හා සේවාලාභීන්ට එකම ස්ථානයක සිට සේවා පහසුකම් සැලසීම මගින් කෙටි කාලයකින් අඩු පිරිවැයකින් කාර්යක්ෂම සේවාවන් සැපයීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම.දියුණු මාර්ග පද්ධතියක් සමන්විත වීම,නිසි පරිදි ජලය බැස යන කානු පද්ධතියක් ජලය,විදුලිය.සන්නිවේදන පහසුකම්,කසළ ඉවත්කිරීම,විථි ලාම්පු,ආදාහනාගර ආදි ප්‍රජාවට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් යටතට ගත හැකිවෙයි.ප්‍රදේශයක පුරවැසියන් පළාත්පාලන ආයතන ,රාජ්‍ය ආයතන සඳහා මුදල් ගෙවීම් සිදුකරනු ලබන්නේ ඉහත සේවාවන් අඩාලවීමකින් තොරව තමන් වෙත ලබාගැනීමට සඳහා වෙයි.

**උපාය මාර්ග:-**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ වසමේ දේශපාලන අදිකාරිය සමඟ සාකච්ඡා කර රේඛීය අමාත්‍යාංශය හරහා මහනගර සභාව සම්බන්ධීකරණය කර අරමුදල් සොයා ගැනීම.

දැනට පොදු ස්ථානයක් ලෙස ඇති වුඩ්ලන්ඩ් ක්‍රීඩාංගනයේ කොටසක නව ගොඩනැගිලි සැලැස්මක් සකස් කිරීම. එම ගොඩනැගිලි සැලැස්මේ සේවාපියස සඳහා කොටසක් වෙන් කිරීම

ළමා හා මාතෘ සායන සඳහා කොටසක් වෙන් කිරීම

පොදු කටයුතු සඳහා කොටසක් වෙන් කිරීම ( රැස්වීම් උත්සව සඳහා )

**ප්‍රතිලාභී පවුල් ගණන**:-පවුල් 1600

**වගකීම**:-දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**කාලය**:- අවුරුදු 1 යි

ගැටළුව:-02

1. මාර්ග  අබලන් වීම නිසා එදිනෙදා කාර්යයන් සඳහා වැයවන කාලය හා ප්‍රමාදය අධිකවීම.
2. සංවර්ධනය කරන ලද මාර්ග කානු වල නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවීම.
3. කාණු වර්ෂා කාලයේදී ජලයෙන් යටවීම නිසා නිවාස දේපල වලට හානි සිදු වීම
4. කාණු බොක්කු නිසි ප්‍රමිතියට ඉදිකිරීම් සිදු නොකිරීම නිසා නැවත නැවත ඉදිකිරීම් නඩත්තු කටයුතු නිරන්තරයෙන් කළයුතු වීම.

අරමුණ:-

- උසස් ප්‍රමිතියෙන් යුත් දිර්ඝ කාලීන පැවැත්මක් සහිත මාර්ග කාණු පද්ධතියක් සැකසීම.
- වර්ෂා ජලය විධිමත්ව බැස යන ලෙස මාර්ග පද්ධතිය සකස් කිරීම
- සංවර්ධනය කරන ලද කාණු හා මාර්ග පද්ධතිය නිසි පරිදි නඩත්තු කිරීම

උපායමාර්ග:-

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු,පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරීයේ තාක්ෂණ සහයද ලබාගෙන තාක්ෂණ නිලධාරී මගින් අබලන්වූ කාණු පරීක්ෂා කර සුදුසු ක්‍රමවේදයක් යටතේ දිගුකාලීන පැවැත්මක් තහවුරු වන පරිදි සංවර්ධනය කිරීම.

ක්‍රියාකාරකම්:-

1. නුගේගොඩ හයිලෙවල් පාර නො:200 පටන් ගන්නා ශ්‍රී විසුද්ධාරාම පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීම (දිග මීටර් 200)
2. වුඩ්ලන්ඩ් මාවත නො:76 පටන් ගන්නා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම (දිග මීටර් 150)
3. මෙල්ඩර් පෙදෙස මහල් නිවාස සංකීර්ණයට යන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම (දිග මීටර් 100)
4. වුඩ්ලන්ඩ් මාවත නො:94 පටන් ගන්නා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම (දිග මීටර් 150)
5. වුඩ්ලන්ඩ් මාවත නො:04 පටන් ගන්නා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම (දිග මීටර් 100)
6. වුඩ්ලන්ඩ් මාවත නො:06 පටන් ගන්නා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම (දිග මීටර් 75)
7. මල්වත්ත පාර නො:13 පටන් ගන්නා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම (දිග මීටර් 100)
8. වුඩ්ලන්ඩ් මාවතේ අංක 46 සිට 44/2 දක්වා මාර්ගය කොන්ක්‍රීට් දැමීම(දිග මීටර් 150)
9. වුඩ්ලන්ඩ් මාවතේ නො 23/2 සිට 33/10 දක්වා අතුරු මාර්ගය කොන්ක්‍රීට් දැමීම(දිග මීටර් 150)
10. අනුර මාවතේ සිට වුඩ්ලන්ඩ් පාර දක්වා ඇති  හරස්පාර කාපට් දැමීම. (දිග මීටර් 150)

11. වුඩ්ලන්ඩ් පාර කාපට් දැමීම(දිග මීටර් 200)

12. වුඩ්ලන්ඩ් මාවත 2 වැනි පටුමඟ තාර යෙදීම(දිග මීටර් 200)

13. ෆීල්ඩ් මාවත සංවර්ධනය කිරීම(දිග මීටර් 200)

14. විජයමංගලාරාම පාරේ නො 45 ආරම්භ වන අතුරු මාර්ගය කුට්ටිගල් ඇල්ලීම (දිග මීටර් 150)

**ප්‍රතිලාභී පවුල් ගණන**:-සෘජු පවුල් 1600-වක්‍රව පුද්ගලයින්-2500

**වගකීම**:-දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය /පලාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

**කාලය:** අවුරුදු 1 යි

**05.යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ( පාසැල් පද්ධතිය)**

537/බී කොහුවල ග්‍රාම නිලධාරි වසමට අයත් ප්‍රධාන පෙලේ පිරිමි පාසැලක් වන නුගේගොඩ ශාන්ත ජෝන් පිරිමි විදුහල පිහිටා ඇත. පලාත් රාජ්‍ය සේවය පාලනය වන මෙම විදුහල ප්‍රාථමික ශ්‍රේණියේ සිට උසස් පෙල දක්වා විෂය ඉගැන්වීම සිදුවෙයි. 1 වසරේ සිට 5 වන වසර දක්වා ප්‍රාථමික විදුහල හා 6 වන ශ්‍රේණියේ සිට උසස් පෙල දක්වා ද්විතීක පංතිකාමර විදුහල්පති / නියෝජ්‍ය විදුහල්පති යටතේ පාලනය වෙයි. විද්‍යාලයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 3154 වෙයි. ගුරුමණ්ඩලය පුහුණු උපාධිධාරි ගුරුවරු, විශේෂ ශ්‍රේණියේ ගුරුවරු ඇතුලු සමස්ථ ගුරුමණ්ඩලය 84 ක් වෙයි.

01.භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම (ශාන්ත ජෝන් ප්‍රාථමික විදුහල / ශාන්ත ජෝන් විදුහල )

1. උසස් පෙල තෙමහල් ගොඩනැගිල්ලේ පංති කාමර පිලිසකර කර ගැනීම
2. ජලනල පද්ධතිය අලුත්වැඩියා කර ගැනීම
3. සුහුරු පන්තිකාමර සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම
4. වැසිකිලි / කැසිකිලි පද්ධතියක් අලුතින් ඉදිකිරීම
5. ආපන ශාලාව අලුත් වැඩියා කර ගැනීම
6. ශ්‍රවණාගාරය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම
7. පරිඝණක විද්‍යාගාරය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම
8. ගොඩනැගිලි වල තීන්ත ආලේප කිරීම

02.භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම (සියළුම පාසල් සඳහා )

1. වේරැස් ගඟ ව්‍යාපෘතිය යටතේ දැනට වැඩ ආරම්භ කර ඇති ෆීල්ඩ් මාවතට යාබද කොටසේ ඇති ගොඩකර ඇති බිම් කොටසේ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම

## 06.යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ( ආගමික ස්ථාන )

කොහුවල ග්‍රාම නිලධාරි වසම අධි ජනගහනයක් සහිත නාගරික ප්‍රදේශයක් සහිත බහු ආගමික ප්‍රජාවක් වෙසෙන ග්‍රාම නිලධාරි වසමක් වෙයි. බෞද්ධාගම අදහන පිරිස බහුතරය වන අතරම හින්දු, කතෝලික, ඉස්ලාම් ආගම අදහන පිරිස් මෙම වසමේ ජීවත් වෙයි. වර්තමානය වන විට විදේශීය රටවලින් දහම් අධ්‍යාපනය හැදෑරීම සඳහා සාමනේර භික්ෂූන් මෙන්ම රටවල විවිධ ආපදා නිසා (මාලදිවයින) ලංකාවට පැමිණ අධ්‍යාපනය හදාරන හා රැකියාවල නිරත විදේශ පිරිස්ද දක්නට ලැබෙයි.

විහාරස්ථාන 4, මෙහෙණි ආරාම 1, රෙපරමාදු ආගමික නිකායට අයත් පල්ලියක් කොහුවල වසමේ වර්තමානය වනවිට ඇත.

1. සිරි සුමනාරාම විහාරය,වුඩ්ලන්ඩ් මාවත
2. නාලන්දාරාම විහාරය,හයිලෙවල් පාර
3. ධාතු මළු විහාරය-සුනේත්‍රාදේවී පාර
4. විජයමංගලාරාමය,විජයමංගලාරාම පාර
5. සංඝමිත්තාරාමය,අනුර මාවත
6. ක්‍රිස්තියානි මීසම-හයිලෙවල් පාර

ආගමික ස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ප්‍රදේශයේ දූදරුවන්ගේ දහම් අධ්‍යාපනය නගාසිටුවීමට ඉරුදින දහම්පාසැල් පවත්වා ගෙන යෑම සුමනාරාම විහාරස්ථානය හැර අනෙකුත් විහරස්ථාන මගින් සිදු කරනු ලබයි මෙම ඉරුදින දහම්පාසැල් සඳහා ඩෙස් බංකු ලබාගැනීම සියලුම විහාරස්ථාන වල පොදු ඉල්ලීම විය. මීට අමතරව ධාතුමලු විහාරස්ථානයේ ඉරුදින දහම්පාසැල් සඳහා ඡායාපිටපත් යන්ත්‍රයක් විජයමංගලාරාම විහාරස්ථානයේ ඉරුදින දහම්පාසැල් සඳහා ශබ්ද විකාශන යන්ත්‍රයක්, ඉරුදින දහම්පාසැල් සඳහා පුස්තකාල කබඩයක් අවශ්‍යතා ලෙස දක්වන ලදි.

## 07.ජීවනෝපාය ව්‍යවසාය සංවර්ධන කාන්තා සවිබලකරන සැලැස්ම:-

පුද්ගලයා තුල මෙන්ම පවුල තුලද එදිනෙදා පැවැත්ම සඳහා කිසියම් වෘත්තියක හෝ රැකියාවක නිරත වීමට සිදුවෙයි. පවුල තුල අවශ්‍යතා සේවාවන් ඉටුකර ගැනීමට මුදල් අවශ්‍ය වෙයි. මුදල් ඉපයීමට නම් රැකියාවක වෘත්තියක නිරතවීම පුද්ගලයා විසින් කළ යුතු වෙයි. 536 බී කොහුවල ග්‍රාම නිලධාරී වසම නාගරික ප්‍රජාවක් සිටියද ස්වයං රැකියාවල නිරත වන පිරිස්ද ජීවත් වෙයි. බොහෝ දුරට ස්වයං රැකියාවක නිරත වුවද නූතන තාක්ෂණික දැනුම ඒ සඳහා යොදා ගැනීම සිදු නොවෙයි. නිෂ්පාදනය සඳහා වෙළඳපොල නොමැති වීමට ප්‍රධාන හේතුව නම් නිෂ්පාදනය සිදුකරන භාණ්ඩවල ගුණාත්මක භාවය අඩු වීමයි. එවිට නිෂ්පාදන භාණ්ඩවල අලෙවිය පහත යයි. අලෙවිය අඩුවීම නිසා ස්වයං රැකියාවල නිරත වන පිරිස් තමා නිරත වන ස්වයං රැකියාවෙන් ඉවත් වීම බහුල වශයෙන් සිදු වෙයි.

ස්වයං රැකියා මගින් ජීවන වෘත්තිය සිදු කරගෙන යනු ලබන පවුල් උදෙසා නිරන්තර අධීක්ෂණය,පසු විපරම,රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකළ යුතුවෙයි.ගුණාත්මක භාණ්ඩ,සේවා නිෂ්පාදනය සඳහා පෙළඹවීමට ස්වයං රැකියා ලාභීන් යොමුකරවීම සිදු කළයුතුයි.

නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා නිෂ්පාදන මුදලක් ලබාගැනිමට වෙළඳපළ සම්බන්ධිකරණය රාජ්‍ය හා පුද්ගලික අංශය හා ඒකාබද්ධ වී සිදු කිරීම කළයුතුවෙයි.ජංගම වෙළඳ රථ,වෙළඳ පළ ස්ථාන,ස්වයං රැකියාලාභීන්ට සහන මිලට ලබාදීමෙන් දිරිමත් කළයුතුවෙයි.ස්වයං රැකියා ලාභීන් සඳහා සහනදායි පොලී අනුපාත යටතේ ණය මුදල් ලබාදීම මඟින් ස්වයං රැකියාවල නිරත වන පිරිස් දිරිමත් කිරීමද රාජ්‍ය අනුග්‍රහය මත සිදුකළ යුතු වෙයි.

පවුලක ආර්ථිකය සඳහා කාන්තාවද වර්තමානය වන විට විශාල දායකත්වයක් ලබා දෙයි. ඇය පවුලේ ආර්ථිකය නංවාලීමට ඍජු හා වක්‍ර යන ආකාර දෙකෙන්ම දායකත්වය සපයයි. 537 බී කොහුවල ග්‍රාම නිලධාරී වසමේ වටලප්පන් නිෂ්පාදනය, ඇඳුම් මැසීම, මනාලියන් හැඩගැන්වීම, බේකරි නිෂ්පාදනය, අහාරපාන සේවා කාන්තාවන් සිදුකරන ස්වයංරැකියාවන් වෙයි.

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දිවිනැගුම ප්‍රජා මූල බැංකුව, සමෘද්ධි බැංකුව හරහා කාන්තාවන්ගේ ආදායම් උත්පාදන මාර්ග ඉහල නැංවීමට සහනදායි පොලියට ණය මුදල් ලබා දීම ස්වයංරැකියා උපකරණ ලබාදීම,ස්වයං රැකියා පුහුණු ලබාදීම සිදුකරනු ලබයි.

වසම තුල ස්වයංරැකියා වැඩිදියුණු කිරීමට ආධාර ණය මුදල් ලබාදෙන ආයතන

1. සණස බැංකුව වුඩ්ලන්ඩ් මාවත ශාඛාව 011-5668274
2. කැන්රිච් මූල්‍ය ආයතනය හයිලෙවල් පාර නුගේගොඩ 011-4385349
3. සමෘද්ධි ප්‍රජාමූල බැංකුව - කොහුවල
4. සමූපකාර ග්‍රාමීය බැංකුව-කොහුවල

කොහුවල ග්‍රාමනිලධාරි වසමේ ජීවනෝපාය, ව්‍යවසාය සංවර්ධනය උදෙසා කොහුවල කොට්ඨාශයේ ස්ථිර ලෙස පදිංචි පිරිස් නිරත කර්මාන්ත ස්වයං රැකියා ඉහතින් දක්වා ඇත. වෙනත් ප්‍රදේශවලින් ඇවිත් තාවකාලිකව පදිංචිවී විවිධ ස්වයං රැකියාවල නිරත වන පිරිස් ඉහත ගනනය කිරීම් සඳහා යොදාගෙන නොමැත. මීට අමතරව එදිනෙදා රියදුරු රැකියාවල නිරත වන පිරිස්ද (ත්‍රීරෝද රථ, බස් රථ, පුද්ගලික අංශයේ වාහන) කොහුවල වසමේ ඇත. ස්වයං රැකියා යටතට අදාල කරගත නොහැකි විවිධ වෘත්තීන් වල නිරත වන ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම කොහුවල වසමේ ජීවත් වෙයි.

මුල්කාලයේදී මෙම වසමතුල කාන්තා සංවර්ධන සමිතියක් පැවතුනද වර්තමානය වන විට එය ක්‍රියාකාරී මට්ටමක නොමැත.

537 බී කොහුවල වසම තුල ස්ථිර පදිංචි වර්තමානයේ ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකරන පවුල් ගණන

| ජීවනෝපාය ක්ෂේත්‍රය | පවුල් ගණන |
|---|---|
| • ලොතරැයිපත් අලෙවිය | 3 |
| • විසිතුරු මසුන් බෝකිරීම හා අලෙවිය | 2 |
| • කුකුළු පාලනය (ගෘහස්ථ පරිභෝජනය සඳහා බිත්තර ලබාගැනිම) | 4 |
| • වටලප්පන් සෑදීම | 5 |
| • යෝගට් සෑදිම | 2 |
| • බේකරි කර්මාන්තය | 3 |
| • සිල්ලර වෙලඳසැල් | 15 |
| • හොටල් ආපනශාලා | 2 |
| • විසිතුරු කුරුළු වර්ග අලෙවිය | 1 |
| • බතික් කර්මාන්තය | 1 |
| • ඇඳුම් මැසීම | 5 |
| • රූපලාවන්‍ය ස්ථාන පවත්වාගෙන යාම | 4 |
| • වඩු කර්මාන්තය | 2 |
| • වෑල්ඩින් වෘත්තිය | 4 |
| • ඡායාරූප ශිල්පය | 2 |

ගැටලු

I. ස්ථිර අදායම් මාර්ගයක් නොමැති නිසා පවුල් තුල සමාජ, ආර්ථික ගැටළු ඇතිවීම

II. නිෂ්පාදන සඳහා වෙළඳපොල නොමැතිවීම

III. නිෂ්පාදනය කරන භාණ්ඩවල ගුණාත්මක බව අඩු වීම

IV. අමුද්‍රව්‍ය මිල අධික වීම

අරමුණු

I. නිෂ්පාදන සඳහා වෙලදපොල සකස්කර දීම

II. නාගරික අඩු ආදායම් ලාභීන්ගේ අදායම් මට්ටම ඉහල නැංවීම

උපායමාර්ග

පවුලේ අදායම් මාර්ග වැඩිදියුණු වන ලෙස ස්වයං රැකියා නිෂ්පාදන වැඩි දියුණු කිරීම

**ක්‍රියාකාරකම්**

I. ස්වයං රැකියා නිෂ්පාදන වෙළඳපොල අවශ්‍යතාවයට සරිලන ලෙස නිෂ්පාදනය කිරීමට දැනුම කුසලතා විදතා සංවර්ධන නිලධාරී හරහා ලබාදීම

II. නව ස්වයංරැකියා අවස්ථා පිළිබඳ වසමේ ප්‍රජාවට දැනුම ලබාදීම (සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමාජිකාවන් සඳහා)

III. ස්වයංරැකියාව වැඩිදියුණුකර ගැනීමට මූල්‍යමය ආධාර සහනදායී ණය පිළිබදව වසමේ ස්වයං රැකියාලාභීන් ණය ලබාදෙන මූල්‍ය ආයතන බැංකු හරහා දැනුවත් කිරීම

**වගකීම**

I. වසම්භාර සංවර්ධන නිලධාරී

II. විදතා සංවර්ධන නිලධාරී

III. සමෘද්ධි සංවර්ධන නිලධාරී

ප්‍රතිලාභීන් :-ස්වයං රැකියාවන්හි නිරත අඩු ආදායම්ලාභී පවුල් /ස්වයං රැකියා අළුතින් ආරම්භ කිරීමට කැමති පුද්ගලයින්

කාලය - අවුරුදු 1යි

## 08.කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම

537 බී කොහුවල ග්‍රාම නිලධාරී වසම නාගරික ජනගහනය අධික පෙදෙසක් වුවත් ගෙවතු වගාව යම් තාක් දුරකට මෙම වසමේ දක්නට ලැබෙයි. එදිනෙදා පාරිභෝජනයට අවශ්‍ය එලවලු වර්ග නිවෙස් වල කුඩා බිම් ප්‍රමාණයක, පෝච්චි වල වගා කර ඇති අතර එය තව දුරටත් වර්ධනය කල යුතු වෙයි. කුඩා බිම් කට්ටියක වගා කල හැකි ක්‍රමවේදයන් පිලිබඳව නිසි අවබෝධය නොමැති කම නිසා තමන් හට අයත් භූමි ප්‍රමාණයෙන් නිසි ප්‍රයෝජනය ලබාගැනීම වර්තමානයේ සිදු නොවෙයි. එදිනෙදා අවශ්‍ය එලවලු පැල වගා කරගැනීම මගින් ශරීර සෞඛ්‍යට හිතකර කාබනික එලවලු ලබාගැනීමේ හැකියාව ලැබෙන අතර මානසික නිරෝගී භාවයටද නාගරික ගෙවතු වගාව පුද්ගලයින්ට එලදායී ලෙස යොදා ගත හැකි වෙයි.

**ගැටලු**

I. ගෙවතු වගාව සඳහා බීජ වර්ග පැල වර්ග නොමැතිවීම

II. ගෙවතු වගාව පිලිබද නාගරික ප්‍රජාවගේ දැනුම අවම වීම

III. ගෙවතු වගාවට උසස් තත්වයේ බීජ නොමැතිවීම

**අරමුණු**

I. නාගරික ප්‍රජාව අතර ගෙවතු වගාව වර්ධනය කිරීම

II. නිවසේ පරිභෝජනයට අවශ්‍ය දෑ ගෙවත්ත තුලම වගා කර ගැනීමට හුරු කරවීම

III. තමන්ට අයත් භූමි ප්‍රමාණයෙන් නිසි ප්‍රයෝජනය ලබාගැනීම වර්තමානයේ සිදු නොවෙයි.

**උපායමාර්ග**

කෘෂිවගාව සම්බන්ධ දැනුම ඇති ආයතන පුද්ගලයින් වසමේ ප්‍රජාවට හඳුන්වා දීම

**ක්‍රියාකාරකම්**

I. ගෙවතු වගාව සඳහා අවශ්‍ය බීජ වර්ග පැල වර්ග ප්‍රජාවට සහන මිලට ලබා දීම

II. නාගරික ගෙවතු වගාව පිලිබද කෘෂි දැනුම ප්‍රජාවට ලබාදීම

**වගකීම**

I. කෘෂිකර්ම නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

II. කෘෂිකර්ම පර්යේෂන නිෂ්පාදන සහකාර - උඩහමුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය

III. ආර්ථික සංවර්ධන නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**ප්‍රතිලාභීන්** :-වගා කිරීමට උනන්දුවක් දක්වන පවුල්

**කාලය** - අවුරුදු 1යි

## 09.පරිසර කලමණාකරන සැලැස්ම

මිනිසාගේ නව සොයාගැනීම් අභියස ඉතා වේගයෙන් විනාශයට පත් වන්නේ ස්වභාවික පරිසරයයි. නාගරීකරණය වැඩි වීමත් සමග පරිසර විනාශයද වැඩිවී ඇත. අවිධිමත් ඉදිකිරීම් වන විනාශය ස්වභාවික ලදු කැලෑ විනාශය නිසා පරිසරය ඉතා වේගයෙන් විනාශ වී ඇත. නිසි කලමණාකරනයකින් තොර මානව ක්‍රියාකාරකම් හමුවේ කොහුවල වසමේ පරිසරයද ඉතා වේගයෙන් වෙනස්කම් වලට භාජනය වී ඇත.

අනවසර ඉදිකිරීම් නිසා ඇලමාර්ග අවහිර වීම්, අක්‍රමවත් නිවාස ගොඩනැගිලි ඉදිකිරීම් නිසා ගංවතුර නිවාස යටවීම් සිදුවීම, කාණු පද්ධති අවහිර වීම වැනි මිනිස් ක්‍රියාකාරකම් නිසා නිරන්තරයෙන් සිදුවෙයි.

**වසම තුල ඇති ඇල මාර්ග:-**

1. වුඩ්ලන්ඩ් මාවත ඇල මාර්ගය- දිග මීටර් 800/පළල අඩි 05
2. නාලන්දාරාම පාර ඇල මාර්ගය- දිග මීටර් 600/පළල අඩි 15
3. විජයමංගලාරාම පාර ඇල මාර්ගය- දිග මීටර් 500/පළල අඩි 08
4. මෙල්ඩර් පෙදෙස ඇල මාර්ගය- දිග මීටර් 800/පළල අඩි 06

වර්තමානය වන විට මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇල මාර්ගය 4 අපිරිසිදු වී ඇත. වසමේ ජීවත්වන පුද්ගලයින් / ව්‍යාපාරික ස්ථාන වල අවිධිමත් ක්‍රියාකාරකම්, අවිධිමත් ඉදිකිරීම් නිසා කොහුවල වසමේ පරිසරයද වර්තමානය වන විට විනාශ වෙමින් පවතී.

නාගරික ප්‍රදේශයක් වන කොහුවල දිනෙන් දින ගොඩනැගිලි අවිධිමත් ලෙස ඉදිකිරීම් හා නීති විරෝධී ක්‍රම මගින් ගොඩනැගිලි ඉදිකිරීම් සිදුකරනු ලබයි. රාජ්‍ය ආයතන වල නිසි අවසරයකින් තොරව ඉඩම් ගොඩකිරීම, ගොඩනැගිලි ඉදිකිරීම රක්ෂිත ප්‍රදේශ සඳහා වෙන්කර ඇති පෙදෙස්වල අනවසර ඉදිකිරීම් නිසා වර්තමානය වන විට ගැටලු රැසකට කොහුවල ප්‍රජාවට මුහුණ දීමට සිදුවී ඇත.

අධික ජනගහනයක් සහිත කොහුවල වසමේ වර්ෂා ජලය බැස යාමට ඇති කාණු පද්ධතියට අපද්‍රව්‍ය යෙදීම, මිනිසුන් විසින් නිවසේ අපවිත්‍ර ජලය කාණුවලට මුදා හැරීම, කාණුවල රොන්මඩ තැන්පත් වීම නිරන්තරයෙන්ම සිදුවෙයි. සමහර ස්ථාන වල ඇල මාර්ගය ගොඩකර ගොඩනැගිලි ඉදිකිරීම දක්නට ලැබෙයි. සෑම මාර්ගයකම වැසි ජලය බැස යාමට ඇති කාණු මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් රොන්මඩ වලින් පිරී යාම දක්නට ලැබෙයි.

කාණු පද්ධතිය අපවිත්‍ර වීම නිසා කාණුවල ජලය බැසයාම විධිමත්ව සිදු නොවෙයි, මේ නිසා ඩෙංගු මදුරුවන් බෝවීම නිසා ඩෙංගු රෝගය බෝවීමේ දැඩි අවධානමක් කොහුවල වසමේ වර්තමානය වන විට උද්ගත වී ඇත.ඩෙංගු රෝගය බෝවීම ඍජුව මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවෙයි.ඩෙංගු රොගීන් ව්‍යාප්තිය වාර්ෂිකව ඉහළ අගයක් ගැනීම නිසා රාජ්‍ය අංශයට විශාල පිරිවැයක් දැරීමට සිදුවී ඇත.කොහුවල වසමේ ප්‍රජාව යහපත් සෞඛ්‍ය පුරුදුවලට අනුගත වීමෙන් ඩෙංගු උවදුර කොහුවල වසමෙන් තුරන් කිරීමේ හැකියාව ඇත.

නාගරික ප්‍රදේශයක් වන කොහුවල ප්‍රධාන මාර්ග අතුරු මාර්ගවල ඇති කානු පද්ධතිය පිරිසිදු කිරීම රාජ්‍ය ආයතන හා පුද්ගලික අංශ ප්‍රජාව මැදිහත් වී සිදුකළයුතු වෙයි.ප්‍රජාවගේ නිසි සහයෝගය නොමැතිව කානු පද්ධතිය පිරිසිදු කිරීම රාජ්‍ය අංශයට තනිවම සිදුකළ නොහැකිවෙයි.

කොහුවල වසමේ සියළුම මාර්ග,කානු පද්ධතිය හරහා ගලායන වර්ෂා ජලය වේරුස් ගඟ වෙත ගෙන එනු ලබන්නේ ඉහත සඳහන් කරන ලද ප්‍රධාන ඇල මාර්ග 04 හරහා වෙයි.වර්තමානය වන විට මෙම ඇලමාර්ග 04 සඳහාම වසමේ නිවෙස්වල අපද්‍රව්‍ය,ව්‍යාපාරික ස්ථානවල අපද්‍රව්‍ය,මුදාහැරීම සිදුකර ඇත.එම නිසා ඩෙංගු මදුරුවන් බෝවීම,අධික දුර්ගන්ධය නිසා පරිසරය අපවිත්‍ර වීමද සිදුව ඇත.මෙම ඇල මාර්ග 04ම නඩත්තු කටයුතු කිසිවක් මේ වන විට සිදු නොවෙයි.වර්ෂා ජලය බැසයාම සිදු නොවන නිසා නිවාස විශාල ප්‍රමාණයක් වර්ෂා ජලයෙන් යටවීම සිදු වෙයි.

ඩෙංගු මර්ධනය සඳහාත් වර්ෂා ජලය නිසි පරිදි බැසයාම සඳහාත් කානු පද්ධතිය හා ඇල මාර්ග නිරන්තරයෙන් පිරිසිදු කිරීම කළයුතු ප්‍රධානතම කාර්යයක් වෙයි.

කොහුවල අධි නාගරික ප්‍රදේශයක් බැවින් එදිනෙදා මිනිස් අපද්‍රව්‍ය ප්‍රමාණය ඉතා විශාල වෙයි.දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ වාර්ෂික වාර්තාවලට අනුව මසකට කොහුවල වසමෙන් පමණක් කසළ ටොන් 04ක ප්‍රමාණයක් ඉවත්කිරීම සිදුවෙයි.බොහෝවිට දෛනිකව ඉවත්කරනු ලබන කසළ ප්‍රමාණය වැඩි නිසා එම ප්‍රමාණය ඉවත්කිරීමට නොහැකි වෙයි.සේවක හිඟය,රථවාහන අවම නිසා මෙලෙස කසල ඉවත්තිරීමට නොහැකි වෙයි.කසළ ඉවත්කිරීම දෛනිකව සිදු නොවන නිසා නිවෙස්වලින් ,ව්‍යාපාරික ස්ථානවලින් ඉවත්කරනු ලබන අපද්‍රව්‍ය වසමේ කාණු හා ඇලමාර්ග වලට මුදාහැරීම සිදුවෙයි.පරිසර හානිය මෙන්ම කානු පද්ධතිය අපවිත්‍රවීම,කානු අවහිර වීම,ඇල මාර්ග අවහිර වීම මේ නිසා සිදුවෙයි.

කොහුවල වසමේ සියලු අතුරු මාර්ගවල කාණු පද්ධතිය පිරිසිදු කිරීම රාජ්‍ය ආයතන ප්‍රජාව මැදිහත්වී සිදු කල යුතු වෙයි.

ගැටලු

**I. කාණු පද්ධතිය අවහිර වීම**

- මෙල්ඩර් පෙදෙස කාණු(දිග මීටර් 75)
- නාලන්දාරාම පාර කාණු(දිග මීටර් 85)
- ආනන්ද පාර කාණු(දිග මීටර් 75)
- තිස්ස මාවත කාණු(දිග මීටර් 95)
- වුඩ්ලන්ඩ් පාර කාණු(දිග මීටර් 75)

**II. ඇල මාර්ග අවහිර වීම**

- මෙල්ඩර් පෙදෙස ඇල මාර්ගය පිටාර ගැලීම
- වුඩ්ලන්ඩ් මාවත ඇල මාර්ගය පිටාර ගැලීම
- විජයමංගලාරාම පාර ඇල මාර්ගය පිටාර ගැලීම
- නාලන්දාරාම පාර ඇල මාර්ගය පිටාර ගැලීම

**III.කසල නියමිත දින රැගෙන නොයෑම.**

**IV. අවිධිමත් ඉදිකිරීම් සිදුවීම**

**V. ඉදිකිරීම් සඳහා රාජ්‍ය ආයතන වලින් නිසි අවසරය නොගැනීම.**

**අරමුණු**

I. වර්ෂා කාලයේදී නිවාස දේපල වලට සිදුවන හානිය අවම කිරීම

II. කොහුවල වසමේ කසල නිසි පරිදි රැගෙන යාමට වැඩපිළිවෙලක් සකස් කිරීම

III. ජලය බැසයන කාණු පද්ධතිය පිරිසිදු කිරීම

IV. අනවසර ඉදිකිරීම් අවම කිරීම

**උපායමාර්ග**

I. නගර සභාව ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය සමඟ සාකච්ඡා කර කසල රැගෙනයාමට හා කාණු පද්ධතිය පිරිසිදු කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම

II. අවිධිමත් ඉදිකිරීම් අවම කිරීමට වැඩ පිළිවෙලක් නගරසභාව,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,නාගරික සංවර්ධන අධිකාරිය,හා අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණයෙන් ඇතිකිරීම

**ක්‍රියාකාරකම්**

I. කොහුවල විජයමංගලාරාම පාරට හා වුඩ්ලන්ඩ් මාවතට මැදිව පිහිටි වගුරු බිම සංවර්ධනය කිරීම

II. අබලන් වී ඇති කාණු ප්‍රතිසංස්කරණය හා පිරිසිදු කිරීම

III. කානු අවහිර වන ලෙස අනවසර ඉදිකිරීම් නගර සභාව පවරා ගැනීම හා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම

IV. ජලය ගලාබසින ඇළ මාර්ග නගර සභාව හරහා නඩත්තු කිරීම

V. නැවත පරිහරනය කලහැකි අපද්‍රව්‍ය මිලදී ගන්නා ආයතන හා පුද්ගලයින් කොහුවල වසම හා සම්බන්ධ කරවීම

VI. සියලුම කාණු පලාත් පාලන ආයතනය සම්බන්ධීකරණය කර පිරිසිදු කිරීම

VII. ඇල මාර්ග දෙපස අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම

**සංවර්ධනය කළයුතු කානු**

I. අනුර මාවත කානු පද්ධතිය සකස්කිරීම (දිග මීටර් 75)

II. නුගේගොඩ විශුද්ධාරාම පාර කානු පද්ධතිය සකස්කිරීම(දිග මීටර් 105)

III. අනුර හරස්පාර කානු පද්ධතිය සකස්කිරීම(දිග මීටර් 85)

IV. වුඩ්ලන්ඩ් මාවත 2 වැනි පටුමග කානු පද්ධතිය සකස්කිරීම(දිග මීටර් 90)

V. ෆීල්ඩ් මාවත විවෘත කානුව කොන්ක්‍රීට් ස්ලැබ් යොදා ආවරණය කිරීම(දිග මීටර් 100)

VI. සුමනාරාම පන්සල අසල සිට වුඩ්ලන්ඩ් මාවත දක්වා කානු පද්ධතිය සකස්කිරීම(දිග මීටර් 75)

VII. වුඩ්ලන්ඩ් මාවත හෙවත් 45 කොටසේ කානුව හා බොක්කුව සංවර්ධනය කිරීම(දිග මීටර් 100

VIII. ඇන්ඩර්සන් ගාර්ඩන්ස් පාරේ වම්පස කොන්ක්‍රීට් කාණුව සංවර්ධනය කිරීම(දිග මීටර් 75)

IX. ආනන්ද පාර කානුවේ අවසන් කොටස සංවර්ධනය කිරීම(දිග මීටර් 105)

X. නාලන්දාරාම පාර කානුව සංවර්ධනය කිරීම(දිග මීටර් 100)

XI. කොහුවල සුනේත්‍රාදේවී පාරේ වික්‍රමරත්න මාවතේ සිට වුඩ්ලන්ඩ් මාවත දක්වා මාර්ගය කොන්ක්‍රීට් දැමීම (දිග මීටර් 100)

XII. 3/3 ෆීල්ඩ් මාවත කානුව සංවර්ධනය කිරීම(දිග මීටර් 100)

**වගකීම**-මහනගර සභාව /ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

**ප්‍රතිලාභීන්** :-පවුල් 1000

**කාලය** - මාස 06යි .

## 10.සමාජ සංවර්ධන සැලැස්ම:-

සමාජයක් සක්‍රීය මට්ටමෙන් පැවතීමට නම් සේවා සැපයීමද නිසි අකාරව පැවතීමද ඉතා වැදගත් වෙයි. ප්‍රජාවගේ ජීවන තත්වය සමාජ සංවර්ධනය හා බැදී පවත්න අංග වෙයි. ප්‍රජාවගේ අවශ්‍යතා සඳහා මිල මුදල් අවශ්‍ය වන්නා සේම සමාජ ගැටලු අවම වීමට සමාජ සංවර්ධනය වර්ධනය වී තිබිය යුතු වෙයි. 537 බී කොහුවල ග්‍රාම නිලධාරී වසම නාගරික ජනගහනය අධික ප්‍රදේශයක් වුවද විවිධ සමාජ ගැටලු මෙම වසමේද දක්නට ලැබෙයි. මෙම වසමේ ප්‍රජාවට ඇතිවන ගැටලු සඳහා එම ගැටළු විසදාගැනීමට,අවශ්‍යතාවය ඇති අයට උපකාර කිරීමට ඔවුන් විසින් පිහිටුවා ගත් සංවිධාන ඇත.

I. කොහුවල ග්‍රාම සංවර්ධන සමිතිය

II. එක්සත් අවමංගල්‍යාධාර සමිතිය

III. කොහුවල සිතසුව ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය

IV. කොහුවල සිවිල් ආරක්ෂක කමිටුව

V. අනුර මාවත එක්සත් අවමංගල්‍යාධාර සමිතිය

ගැටලු

I. දරුවන් හා තරුණ පිරිස මත්ද්‍රව්‍ය වලට අබ්බැහිවීම

II. වැඩිහිටියන් සමාජයේ හුදකලා වීමෙන් පීඩාවට පත්වීම

**අරමුණු**

I. මත්ද්‍රව්‍ය වලට අබ්බැහිවන පිරිස් අවම කිරීම

II. මත්ද්‍රව්‍ය භාවිතා කරන කණ්ඩායම් එයින් මුදවා ගැනීම

III. වැඩිහිටි ප්‍රජාව සක්‍රීය සමාජ ක්‍රියාකාරීන් බවට පත් කිරීම

**උපායමාර්ග**

I. වසම තුල නිති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය / ලග තබා ගැනීම අවම කිරීම සඳහා පොලීසිය අන්තරායක ඖෂධ පාලක මණ්ඩලය, සිවිල් ආරක්ෂක කමිටුව හරහා වැඩපිළිවෙලක් සකස් කිරීම

II. වැඩිහිටි ප්‍රජාව සවිබලකර සමාජ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වීමට හැකි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

**ක්‍රියාකාරකම්**

I. මත්ද්‍රව්‍ය විකිණීම ලග තබා ගැනීම සිදුකරන පුද්ගලයින් කණ්ඩායම් හදුනා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවක් වසම තුල පිහිටුවා එම තොරතුරු නිවාරණ අංශ වෙත ලබා දීම.

II. සමාජ සංවර්ධන වැඩසටහන් සඳහා වැඩිහිටි ප්‍රජාව දායක කර ගැනීම.

III. වැඩිහිටි ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් වසමේ සංස්කෘතික කලා කටයුතු සංවිධානය කිරීම

**වගකීම**

අන්තරායක ඖෂධ පාලක මණ්ඩලය-උපදේශන නිලධාරී

සමාජ සේවා නිලධාරී-ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

ප්‍රජා පොලිස් ඒකකය-කොහුවල වසම

වසම භාර සංවර්ධන නිලධාරී/ග්‍රාම නිලධාරී/සමෘද්ධි නිලධාරී

**ප්‍රතිලාභීන්** :- වසමේ වැඩිහිටි ප්‍රජාව හා තරුණ ප්‍රජාව

**කාලය-**අවුරුදු 01යි.

## 11.නිපුණතා සංවර්ධනය හා හැකියා වර්ධන සැලැස්ම

පුද්ගලයාගේ ආර්ථික දියුණුව සඳහා කිසියම් වූ වෘත්තියක / රැකියාවක යෙදෙමින් මුදල් ඉපයීම සිදුකල යුතු වෙයි. පුද්ගලයකු සතු දැනුම කායික හා මානසිකව මුදල් ඉපයීමට අවශ්‍ය වෙයි. කෙනෙකු කායික ශක්තිය වැය කරමින් කිසියම් වෘත්තියක රැකියාවක නිරත වන විට තව කෙනෙකු මානසික ශක්තිය වැය කරමින් රැකියාවක නිරත වෙයි. පුද්ගලයාගේ දියුණුව මෙන්ම ගම / රට දියුණු වීමට පුද්ගලයාගේ හැකියාව දක්ෂතාවය මත ආර්ථික දියුණුව ලබා ගැනීමේ හැකියාව ලැබෙයි.

බොහෝවිට කොහුවල වසමේ රාජ්‍ය අංශය හෝ පුද්ගලික අංශයේ සේවාවන් වල නිරත වන පිරිස බහුල වෙයි, නිෂ්පාදන ක්‍රියාවලියට ඍජු දායකත්වයක් මොවුන්ගෙන් නොලැබුණද වක්‍රව පුද්ගලිකව මෙන්ම රටේ දියුණුවටද විවිධ වෘත්තීන් වල යෙදෙන පිරිස් කොහුවල වසමේ ස්ථිර හා තාවකාලිකව ජීවත් වෙයි.

කොහුවල වසමේ පාසැල් අධ්‍යාපනය අතර මඟ අවසන් කරන තරුණ පිරිස් ව්‍යාපාරික කටයුතු, රියදුරු රැකියාවන් වල නිරත වීම දක්නට ලැබෙයි. එසේම පාසැල් අධ්‍යාපනය අවසන් කරන ලද තරුණ පිරිස් සම්ප්‍රදායික රැකියා හෝ කර්මාන්ත වල නිරත වීම අවම මට්ටමක පවතියි. වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන කිහිපයක් (පුද්ගලික අංශයේ) මෙම වසමේ තිබුණද එම ආයතනවල වෘත්තීය අධ්‍යාපනය හදාරනු ලබන්නේ වෙනත් ප්‍රදේශවලින්පැමිණෙන තරුණ පිරිස් වෙයි.

ගැටලු

I. පාසැල් හැරයන තරුණ තරුණියන් තුල වෘත්තීය කුසලතා අවම වීම
II. සම්ප්‍රදායික කර්මාන්තවල නිරතවන පිරිස් සඳහා න්‍යායාත්මක හා ප්‍රයෝගික පුහුණුව අඩු මට්ටමක පැවතීම
III. සම්ප්‍රදායික කර්මාන්ත සඳහා සමාජයෙන් හා රජයෙන් ලැබෙන අඩු ගරුත්වය
IV. වෘත්තීය පුහුණුව ලබාගත්තද එය කරගෙන යාමට ණය පහසුකම් ,අමුද්‍රව්‍ය ,තාක්ෂණික ගැටලු පැන නැගීම.

අරමුණු

I. තරුණ තරුණියන්ගේ නිපුණතා මට්ටම ඉහල නැංවීම.
II. පාරම්පරි වෘත්තීන් වල නිරතවන පිරිස් සඳහා න්‍යායාත්මක හා ප්‍රයෝගික දැනුම වර්ධනය කිරීම

ක්‍රියාකාරකම්

I. වසම තුල ඇති වෘත්තීය පුහුණු ආයතන සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් යොමු කරවීම.

   ඩීම්රොන් ආයතනය කොහුවල - රූපලාවන්‍ය පුහුණුව (ස්ත්‍රී / පුරුෂ)
   - රූපලාවන්‍ය අමුද්‍රව්‍ය අලෙවිය (ස්ත්‍රී / පුරුෂ)

II. ආසියානු ලංකා හොටල් පාසල

- හෝජනාගාර සේවය
- පෙරදිග / අපරදිග ආහාරපාන සෑදීම
- හෝටල් කළමනාකරණය

III.වුඩ්ලන්ඩ් මාවතේ ඇති පැරණි සමුපකාර ගොඩනැගිල්ල කඩා ඉවත් කර දෙමහල් ශාලාවක් ඉදිකර පළමු මහලේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථායක් ඇති කිරීම

වගකීම-නිපුණතා සංවර්ධන නිලධාරී/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ග්‍රාම නිලධාරී/සමෘද්ධි නිලධාරී/මානව සම්පත් සහකාර නිලධාරී

**ප්‍රතිලාභීන්** :- වසමේ රැකියා විරහිත තරුණ පිරිස

**කාලය**-අවුරුදු 01යි.

කොහුවල වසම තුල රැකියා අවස්ථා සඳහා වෘත්තීය පුහුණුව සමඟ තරුණ පිරිස් සඳහා අවකාශය තිබුණද ඔවුන් ඒ සඳහා යොමු වීම අවම මට්ටමක පවතියි. බොහෝ විට තරුණ ප්‍රජාව ශිල්පීය ඥානය ලබාගෙන කිසියම් වෘත්තියක නිරතවීම වෙනුවට එදිනෙදා මුදල් ලැබෙන රැකියා වන රියදුරු, වෙළඳ සහායක වැනි රැකියාවල නිරත වීම දක්නට ලැබෙයි.

වර්තමානය වන විට මාසිකව විශාල වැටුපක් ලබාගත හැකි රථවාහන නඩත්තුව, රථවාහන පින්තාරු කිරීම, රථවාහන, නිවාස වයරින් කිරීම වැනි ස්ථාන කොහුවල ග්‍රාම නිලධාරි වසමේ තිබුනද එම ස්ථානවල පුහුණු ශ්‍රමිකයින් නොමැති කමින් විවිධ දුෂ්කරතා වලට පුද්ගල ආයතන හිමියන්ට මුහුණ පෑමට සිදුවී ඇත . ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා එක්ව කොහුවල වසමේ එවැනි ශිල්පීය ස්ථාන කොහුවල වසමේ අළුතින් ආරම්භ කළයුතුය. එවැනි ස්ථාන සඳහා කොහුවල රැකියා විරහිත තරුණ ප්‍රජාව සම්බන්ධ කර ගැනීමට මෙමගින් අවස්ථාව උදා කර ගත හැකි වෙයි.

## 12.වසමේ ඇති වැදගත් ස්ථාන

**ආගමික ස්ථාන**

නාලන්දාරාම විහාරස්ථානය

විජයමංගලාරාම විහාරස්ථානය

ධාතුමළු විහාරය

ශ්‍රී සුමනාරාම විහාරය

ශ්‍රී සංඝමිත්තා ආරාමය

ලංකා පෙන්තකොස්ත සභා මීසම

**වසමේ ඇති පෙර පාසැල්**

ශ්‍රී සංඝාවාස පෙර පාසැල

ඇන්ඩර්සන් පෙර පාසැල

ජාත්‍යන්තර පෙර පාසැල

බ්‍රිස්බේන් පෙර පාසැල

**වසමේ ඇති ව්‍යාපාරික ස්ථාන**

පොදු වෙළඳ සංකීර්ණය කොහුවල

ලාෆ් සුපිරි වෙළඳ සැල

ලංකා පිරවුම් හල නුගේගොඩ

සී අයි බී ඇඳුම් ප්‍රදර්ශනාගාරය

නෝලිමිට් ඇඳුම් ප්‍රදර්ශනාගාරය

මංජරී ඇඳුම් ප්‍රදර්ශනාගාරය

සීමෙඩ් වෛද්‍ය රසායනාගාරය

**රජයේ පාසල්/පෞද්ගලික පාසල් /විශ්ව විද්‍යාල**

සෞන්දර්ය විශ්වවිද්‍යාල කලා පරිශ්‍රය

ශාන්ත ජෝන් විද්‍යාලය

ශාන්ත ජෝන් ආදර්ශ ප්‍රථමික විද්‍යාලය-නුගේගොඩ

රෝයල් ඉන්ස්ටිටියුට් පුද්ගලික පාසැල

ලුවර් පුද්ගලික පාසැල

**<u>රාජ්‍ය ආයතන</u>**

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය

ජාතික වෛද්‍ය ප්‍රවාහන ආයතනය

ලංකා සතොස වෙළඳසැල

**<u>පෞද්ගලික වෘත්තීය පුහුණු ආයතන</u>**

ආසියානු ලංකා හෝටල් පාසල

විවිරොන් ආයතනය

## 13.වසමට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන්

ග්‍රාම නිලධාරී බී. එස්. එම්. අජිත් මයා

ආර්ථික සංවර්ධන නිලධාරී මධුශංක බණ්ඩාර මයා

සමෘද්ධි සංවර්ධන නිලධාරී උදයානි වික්‍රමනායක මිය

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී එච්. එල්. නන්දනී මිය

කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරී -රොෂාන් හේමන්ත  මහතා

සිවිල් ආරක්ෂක කමිටු සභාපති පී. පී. ලක්ෂමන් පීරිස් මහතා

ග්‍රාම සංවර්ධන සභාපති ශාලුක උදයංග පීරිස් මහතා

## 14.වසමේ දේශපාලන බල අධිකාරිය

සමන්ත ඉංද්‍රජිත් ද කොස්තා මහතා (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ) මහ නගර සභා මන්ත්‍රී

සමන්මලී ගුණසිංහ මිය (ජනතා විමුක්ති පෙරමුණ) මහ නගර සභා මන්ත්‍රීනි